# පුරාවිද්‍යා උපාධිධාරියෙකු සතු විය යුතු භාෂා කුසලතාවය

බී.එස්.පී. කුමාරි[1]

පුරාවිද්‍යා උපාධිධාරියෙකුට විවිධ ක්ෂේත්‍රයන්හි රැකියාගත වීමට අවකාශය පවතියි. නමුත් එහිදී පුරාවිද්‍යා උපාධියට අමතරව තවත් සුදුසුකම් ඒ ඒ වෘත්තීන්ට අදාළව පවති. එලෙස අවශ්‍යවන්නා වූ සුදුසුකම් පුරාවිද්‍යා අධ්‍යයන කටයුතු සඳහා අන්තර්ගත නොකිරීම ගැටලුවකි. මෙම අධ්‍යයනයේදී දී මූලික අවධානය යොමු කරනුයේ පුරාවිද්‍යා විෂය නිර්දේශයට භාෂාවක් ඇතුළත් කිරීමේ වැදගත්කම සම්බන්ධවයි. මෙම පර්යේෂණයට අදාළව දත්ත රැස්කිරීමේදී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ආදි ක්‍රමවේදයන් යොදාගනු ලැබිණි. සංචාරක ක්ෂේත්‍රය සහ වෙනත් එවැනි ක්ෂේත්‍ර කිහිපයකින් තෝරාගත් ආයතන වෙත විද්‍යුත් තැපැල මගින් සම්බන්ධ වී ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු ලබාගන්නා ලදී. මෙම අධ්‍යයනයෙන් පෙනී යන මූලික කරුණක් වනුයේ පිළිගත් භාෂාවක් ඉගෙනීම බොහෝ දේශීය මෙන්ම විදේශිය වෘත්තීන් සඳහා ද පිවිසීමට පුරාවිද්‍යා උපාධිධාරියෙකුට ඉඩකඩ විවර කරන්නක් බවයි. පුරාවිද්‍යා විෂය බහු විෂයාත්මක වේ. එහිදී පුරාවිද්‍යා උපාධිධාරියෙකුට විවිධ අංශ ඔස්සේ රැකියාගත වීමට අවකාශය ලැබේ. එහිදී පිළිගත් භාෂාවක් අධ්‍යයන ක්‍රියාවලියට ඇතුළත් කිරීම තුළින් ඒකාකාරී රැකියා රටාවෙන් පිටත මනා චේතනයක් සහිතව වරප්‍රසාදයන් සහිතව වෘත්තියකට පිවිසීමට හැකියාව හිමිවන බව තහවුරු විය. පුරාවිද්‍යාව පිළිබඳ විශේෂඥයන් සඳහා දේශීය මෙන්ම විදේශීය රටවල් තුළ ද මනා රැකියා වෙළඳපොළක් පැවතිය ද ඊට අවශ්‍ය අමතර සුදුසුකම් රැකියා අපේක්ෂක පුරාවිද්‍යා උපාධිධාරීන් බහුතරයකට නොවන බව මෙම පර්යේෂණය මගින් පෙනී ගිය කරුණකි. විශේෂයෙන්ම ප්‍රංශ වැනි භාෂාවක් අධ්‍යයනයන් තුළට යොදාගන්නේ නම් දේශීය මෙන්ම විදේශීය සංචාරක ක්ෂේත්‍රය තුළ මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන තුළ ද පුරාවිද්‍යා උපාධිධාරියෙකුට ඉහළ රැකියා වෙළඳපොළක් පවතින බව අනාවරණය විය. එසේම වාස්තුවිද්‍යාව, සැලසුම්කරණය, ඡායාරූප හා වීඩියෝකරණය ආදි විවිධ ක්ෂේත්‍රයන් තුළට පුරාවිද්‍යා උපාධිධාරියෙකුට රැකියාගත වීමට අවකාශය පවතින අතර ඊට අවශ්‍ය නව තාක්ෂණික දැනුම, පරිගණක දැනුම, භාෂා කුසලතාවය ආදිය ද නොමැති වීම ප්‍රධාන ගැටලුවක් බව මෙමගින් අනාවරණය විය. සංචාරක ක්ෂේත්‍රයේ රැකියා ගත වීමට නම් එය අනිවාර්ය කාර්යයක් බව මෙම පර්යේෂණය මගින් තහවුරු විය. පුරාවිද්‍යා උපාධියක් සහිත උපාධිධාරියෙකු රැකියාවන්ට ඉල්ලුම් කිරීමේදී ප්‍රධාන වශයෙන් භාෂා කුසලතාවය පවතී නම් ඉල්ලුම් කළ හැකි රැකියා ප්‍රමාණය ද ඉහළ මට්ටමක පවතින බව අවසන් වශයෙන් නිගමනය කළ හැකි අතර ඒ සඳහා පුරාවිද්‍යා විෂය නිර්දේශයන් තුළට ඉංග්‍රීසි භාෂාවට අමතරව වෙනත් විදේශීය භාෂාවක් ඇතුළත් කරන්නේ නම් යෝග්‍ය යැයි යෝජනා කරනු ලැබේ. මෙම අවශ්‍යතා පූරණය කරමින් ශාස්ත්‍රීය පුරාවිද්‍යා විෂයයට සමගාමී ලෙස තාක්ෂණික යෙදවුම් සහ ව්‍යාපෘති හැසිරවීම පිළිබඳ උරුම කළමනාකරණමය ප්‍රවේශයකින් නව විෂයයක් ඉදිරිපත් විය යුතු බව ද පෙනීයයි.

ප්‍රමුඛ පද : පුරාවිද්‍යාව, උපාධිධාරී, කුසලතා, රැකියා කෂේත්‍රය

[1] පුරවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය sachiprabha1997330@gmail.com